# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2355/29 - 2023 ඔක්තෝබර් මස 25 වැනි බදාදා - 2023.10.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වගන්තිය යටතේ වන නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය සමග කියවිය යුතු 27(1)(ආ) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධ්‍යාපන අමාත්‍ය ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත වන මා විසින්, 1959 අංක 23 දරන වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය පනත යටතේ පිහිටුවන ලද, අංක 30 ඒ, මලලසේකර මාවත, කොළඹ 07 යන ස්ථානයේ පිහිටි උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් ලෙස පිළිගනු ලබන ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) සම්බන්ධයෙන්, ඉහත කී පනතේ 70ඇ වගන්තිය යටතේ වාර්තාවක් ලබා ගැනීමෙන් පසු, මේ නියමය මගින්, එකී පනත යටතේ සාදනු ලැබූ 2023 ජූලි මස 17 වැනි දින අංක 2341/08 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමයේ II වන උපලේඛනයේ I වන තීරයේ දැක්වෙන "ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී" යන සටහනට හා එහි II වන තීරයේ දැක්වෙන "ව්‍යාපාර විශ්ලේෂණය පිළිබඳ කළමනාකරණවේදී" යන සටහනට හා එහි II වන තීරයේ අනුරූප සටහනට ඉක්බිතිවම, මෙහි II වන උපලේඛනයේ පිළිවෙලින් I වන හා II වන තීරයන්හි නිශ්චිතව සඳහන් සටහන් මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොන්දේසිවලට යටත්ව එකතු කිරීම මගින් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**I වන උපලේඛනය**

***කොන්දේසි***

1. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) විසින්, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති උපාධි පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ දී අවම අධ්‍යයන සම්භාර 60 ක් සහිතව (SLQF 10 වන මට්ටම) සම්පූර්ණ කළ යුතු ව්‍යාපාර පරිපාලනපති (ඉගැන්වීම් පාඨමාලාව සහ පර්යේෂණ සංරචකය සහිත) පාඨමාලාව සම්බන්ධයෙන්,

   (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ව්‍යාපාර හෝ කළමනාකරණය සම්බන්ධ විෂය ධාරාවෙන් ලබාගත් (වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළත්) පළමු හෝ දෙවන පන්තියේ ගෞරව ප්‍රථම උපාධියක් ලබා තිබීම ; හෝ

   (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ව්‍යාපාර ආයතනයකින් හෝ කළමනාකරණය සම්බන්ධ විෂය ධාරාවෙන් ලබාගත් (වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළත්) ගෞරව ප්‍රථම උපාධියක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසුව අවම වශයෙන් වසරක (01) වෘත්තිය පළපුරුද්ද ලබා තිබීම ; හෝ

1A - PG 6511 — 286 (2023/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයකින් ව්‍යාපාර හෝ කළමනාකරණය සම්බන්ධ විෂය ධාරාවෙන් ලබාගත් (වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළත්) ප්‍රථම උපාධියක් සහ එම සුදුසුකම ලැබීමෙන් පසුව අවම වශයෙන් වසරක (01) වෘත්තිය පළපුරුද්ද ලබා තිබීම ; හෝ

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ඕනෑම විෂය ධාරාවක් යටතේ ලබාගත් ප්‍රථම උපාධියක් සහ අවම වශයෙන් ව්‍යාපාර හෝ කළමනාකරණය සම්බන්ධ විෂය ධාරාවෙන් ලබාගත් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (වාණිජ්‍ය, ආර්ථික විද්‍යාව, රාජ්‍ය පරිපාලනය හෝ ඉංජිනේරු කළමනාකරණය ඇතුළත්) ලබා තිබීම ; හෝ

(ඉ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් හෝ උසස් අධ්‍යාපන විෂය භාර අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයකින් ඕනෑම විෂය ධාරාවක් යටතේ ලබාගත් ප්‍රථම උපාධියක් සහ එම සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර දෙකක (02) වෘත්තිය පළපුරුද්ද ලබා තිබීම ; හෝ

(ඊ) පහත සඳහන් එක් ආයතනයක වෘත්තීය සුදුසුකම් සහිත සාමාජිකයකු වීම සහ අවම වශයෙන් වසර දෙකක (02) වෘත්තීය පළපුරුද්ද ලබා තිබීම ; හෝ

I. ශ්‍රී ලංකා වරලත් ගණකාධිවරයන්ගේ ආයතනය (CA Sri Lanka)
II. වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනය (CIMA)
III. වරලත් සහතිකලාභී ගණකාධිකාරීවරුන්ගේ ආයතනය (ACCA)
IV. ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM)
V. ශ්‍රී ලංකා වරලත් බැංකු කරුවන්ගේ ආයතනය (AIB)
VI. වරලත් අලෙවිකරණ ආයතනය එක්සත් රාජධානිය (CIM - United Kingdom)
VII. වරලත් බැංකුකරුවන්ගේ ආයතනය එක්සත් රාජධානිය (ACIB - United Kingdom)
VIII. වරලත් පිරිස් කළමනාකරණ ආයතනය (CIPM)
IX. වරලත් ලේකම්වරුන්ගේ සහ පරිපාලකයන්ගේ ආයතනය

(උ) පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් ලබා තිබීම සහ අවම වශයෙන් වසර දෙකක (02) වෘත්තිය පළපුරුද්ද ලබා තිබීම

I. ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) පිරිනමන සිවු අවුරුදු උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDA) හෝ සිවු අවුරුදු උසස් ජාතික වාණිජ්‍ය ඩිප්ලෝමා පාඨමාලාව (HNDC)
II. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥ

යන අවම ඇතුළත් කරගැනීමේ සුදුසුකම්වලට අනුකූලව කටයුතු කළ යුතුය.

2. නිශ්චිත බලධරයා විසින් පවත්වනු ලබන පස් අවුරුදු (05) සමාලෝචනයට යටත්ව මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන උපාධිය පිරිනැමීම සඳහා ලංකාවේ වරලත් ගණකාධිකාරීවරයන්ගේ ආයතනය (ICASL) පිළිගනු ලැබේ.

**II වන උපලේඛනය**

| *I වන තීරය*<br>*උපාධි පාඨමාලාව* | *II වන තීරය*<br>*උපාධිය සඳහා වන කෙටි යෙදුම* |
|---|---|
| ව්‍යාපාර පරිපාලනපති | එම්. බී. ඒ. |

**ආචාර්ය ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත** (පා.ම),
අධ්‍යාපන අමාත්‍ය.

2023 ඔක්තෝබර් මස 16 වැනි දින,
කොළඹ දී ය.

EOG 10 - 0257

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.